## WEATHER FORECAST FOR 06 NOVEMBER 2019

(Issued at 05.30 a.m. on 06 November 2019)

**Showery condition over the island is expected to reduce to some extent temporary today. However there is a possibility for afternoon thundershowers at a few places in Sabaragamuwa, Uva and Southern provinces and in Kaluthara district.**

Showers or thundershowers may occur at a few places in Colombo, Gampaha and Galle districts during the morning too.

Misty conditions can be expected at some places in Western, Sabaragamuwa, Central, Southern and Uva provinces during the morning.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

අද දින තුලදී දිවයිනේ වැසි තත්ත්වය තාවකාලිකව තරමක අඩුවීමක් බලාපොරොත්තු වේ. කෙසේවෙතත් සබරගමුව, ඌව සහ දකුණු පළාත්වලත් කළුතර දිස්ත්‍රික්කයේත් ස්ථාන ස්වල්පයක සවස් කාලයේ ගිගුරුම් සහිත වැසි ඇතිවීමට හැකියාවක් පවතී.
කොළඹ, ගම්පහ සහ ගාල්ල දිස්ත්‍රික්කවල ස්ථාන ස්වල්පය උදෑසන කාලයේදීත් වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

බස්නාහිර, සබරගමුව, මධ්‍යම, දකුණු සහ ඌව පළාත්වල ඇතැම් ස්ථාන වල උදෑසන කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් බලාපොරොත්තු විය හැක.

ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 05.30 a.m. on 06 November 2019)

**The low pressure area in the east-central and adjoining southeast Bay of Bengal and North Andaman sea area has developed into a depression and it is now located near latitude 13.3N, longitude 88.9E.**
**It is very likely to move west-northwards, concentrate into a deep depression during next 12 hours. It is also very likely to intensify further into a cyclonic storm and move north-westwards during subsequent 48 hours.**
**Heavy showers/thundershowers, strong winds and rough seas can be expected in the above sea areas. Naval and fishing communities (particularly Multiday boats) are requested to be vigilant in this regards.**

Showers or thundershowers will occur at several places in the sea areas extending from Galle to Pottuvil via Hambantota.
Winds will be Westerly to South-westerly in the sea area extending from Puttalam to Kankasanturai via Mannar and speed will be (15-30) kmph. Winds will be North-westerly to Northerly and speed will be (30-40) kmph in the other sea areas around the island.

**Temporarily strong gusty winds (up to 70-80 kmph) and very rough seas can be expected during thundershowers.**

### ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය 2019 නොවැම්බර් මස 06 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදී.

උතුරු අන්දමන් මුහුදු ප්‍රදේශයේ සහ යාබද ගිනිකොනදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති අඩු පීඩන කලාපය මේ වන විට පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී 13.3N, 88.9E ආසන්නව පවතී. එය ඉදිරි පැය 12 තුලදී ගැඹුරු පීඩන අවපාතයක් දකවා වර්ධනය වී වයඹ දෙසට ගමන් කරනු ඇත. මෙම පද්ධතිය ඊළඟ පැය 48 තුලදී තවදුරටත් සුළිකුණාටුව දක්වා වර්ධනය වී වයඹ දෙසට ගමන් කරනු ඇතැයි බලාපොරොත්තු වේ. එම මුහුදු ප්‍රදේශයේ තද වැසි/ගිගුරුම් සහිත වැසි, තද සුළං සමඟ රළු මුහුදු ප්‍රදේශ බලාපොරොත්තු විය හැක. ධීවර සහ නාවුක ප්‍රජාව(විශේෂයෙන්ම බහුදින ධීවර යාත්‍රා) මේ පිලිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

ගාල්ල සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

පුත්තලම සිට මන්නාරම හරහා කන්කසන්තුරය දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළං බස්නාහිර සිට නිරිත දක්වා වන දිශාවලින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී.(15-30) පමණ වේ. සෙසු මුහුදු ප්‍රදේශවල සුළං වයඹ සිට උතුර දක්වා වන දිශාවලින් හමා එන අතර සුළගේ වේගය පැ.කි.මී.(30-40) පමණ වේ.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල (පැ.කි.මී. 70-80 දක්වා) තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date: 2019/11/06
Time: 0553hrs
D (Ops)/DC/ADO
DISASTER MANAGEMENT CENTRE